**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 23 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු පිරිවැය රු. 720,000 ක් වූ කළමනාකරණ තොරතුරු පද්ධතියේ වටිනාකම සහ රු. 20,493 ක් වූ පරිගණක පුටු මිලදී ගැනීමේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සභා අරමුදලින් ඉටු කරන ලද කර්මාන්තයක් සඳහා රු. 44,564 ක් අඩුවෙන් ණයහිමි ප්‍රතිපාදනද, ප්‍රාග්ධන ආධාර යටතේ ඉටුකර තිබූ කර්මාන්ත 04 ක් සඳහා රු. 84,459 ක් වැඩියෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදනද ඇති කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ විගණන ගාස්තු සඳහා රු. 50,000 ක් වැඩිපුර ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 04 ක ශේෂ සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛනවල දැක්වෙන ශේෂ අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 966,571 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට සහ 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළව අයවිය යුතු පිළිවෙලින් රු. 2,512,199 ක් වූ කර්මාන්ත ආධාර සහ රු. 1,046,359 ක් වූ වාහන කුලී අයකර ගෙන නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ එකතුව රු. 4,505,462 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ සහ එකතුව රු. 5,396,252 ක් වූ වියදම් ණයහිමි ශේෂ ගෙවා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණු අතර, වියදම් ණයහිමි ශේෂය තුළ ඇතුළත් රු. 4,834,399 ක් දීර්ඝ කාලයක සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව ඇති ශේෂයකි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

**---------------------------------------------------**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 272,569,939 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**----------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (2) වගන්තිය | වෘත්තිකයන් සම්බන්ධයෙන් බදු අය කළ හැකි වුවද, සභාව විසින් නීතිඥ වෘත්තියට අදාළ ආයතන වලින් වෘත්තීය බදු අය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු. 847,542 ක් වූ තැන්පතු ශේෂ 51 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 11 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

**2.**

**මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු. 12,955,657 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,555,250 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 2,547,370 | 2,393,872 | 2,333,308 | 1,391,165 | 2,848,849 | 2,751,934 | 2,677,050 | 1,336,870 |
| ii කුලී | 10,178,040 | 10,337,145 | 10,424,977 | 2,488,957 | 9,498,119 | 9,200,572 | 9,243,629 | 2,576,789 |
| iii බලපත්‍ර ගාස්තු | 1,224,360 | 1,672,993 | 1,695,043 | 14,250 | 797,800 | 1,212,241 | 1,177,691 | 36,300 |
| iv වෙනත් ආදායම් | 15,318,810 | 15,374,285 | 8,333,864 | 20,348,651 | 14,713,314 | 13,789,373 | 19,688,378 | 25,829,001 |
| එකතුව | 29,268,580 | 29,778,295 | 22,787,192 | 24,243,023 | 27,858,082 | 26,954,120 | 32,786,748 | 29,778,960 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම රු. 29,778,295 ක් වූ අතර, ඉන් රු. 22,787,192 ක් රැස්කර තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

-----------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 1,391,165 ක් වූ අතර, එම හිඟය අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුලී**

-----

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු. 862,036 ක් වූ හිඟ කඩ කුලී ශේෂයෙන් කඩ කාමර 14 ක හිඟය මාසික වාරික 6 සිට 96 දක්වා වූ කාලයට අදාළව පැවතුණු අතර, ගිවිසුම් ප්‍රකාරව කඩ කාමර නැවත පවරා ගැනීමට හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) i. බෙලිඅත්ත නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 48 ක්, නව පුස්තකාල සායන ගොඩනැගිල්ලේ කඩ කාමර 25 ක් සහ බණ්ඩරවත්ත පොදු වෙළඳපොළෙහි කඩ කාමර 20 ක් බදු දීමේදී 2010 දෙසැම්බර් 27 දිනැති, අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ අංක 01 ඡේදයට අනුව කටයුතු කර නොතිබුණි.

ii. උක්ත චක්‍රලේඛයේ 04 ඡේදයට අනුකූලව එක්වන් මුදල් අයකර නොගැනීම නිසා බෙලිඅත්ත නව වෙළඳ සංකීර්ණයේ බදුකරුවන් නව දෙනෙකුගෙන් සහ නව කාර්යාල පුස්තකාල සායන ගොඩනැගිල්ලේ බදු කරුවන් පස් දෙනෙකුගෙන් 2018 මැයි 23 දින වන විට තවදුරටත් අයවිය යුතු එක්වන් මුදල් වල වටිනාකම රු. 2,181,000 ක් විය.

**2.2.5 බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු**

--------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 , 150 හා 152 යන වගන්ති ප්‍රකාරව නියමිත පරිදි ගාස්තු අයකර නොගැනීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට රු. 14,250 ක බලපත්‍ර ගාස්තු සහ රු. 47,000 ක කර්මාන්ත හා ව්‍යාපාර බදු අයවිය යුතුව පැවතුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 852,938 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 19,495,713 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ සභාව විසින් ඉටු කළ යුතු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------------

i. දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම - 2016 සහ 2017 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පොදු ළිඳක් ඉදිකිරීම වෙනුවෙන් රු. 775,000 ක මුදලක් සභාවට ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

ii. ඇස්තමේන්තුගත මුදල රු. 620,000 ක් වූ ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වන විට රු. 365,486 ක මුදලක් වැය කර තිබූ නමුත්, ඉන් ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

i. දෛනිකව රැස්කරන කසළ වලින් කොටසක් පමණක් කොම්පෝස්ට් නිෂ්පාදනාගාරය වෙත යවා ඉතිරි කොටස බෙලිගල්ල හාල්පන්දෙනියේ පිහිටි පුද්ගලික ඉඩමකට බැහැර කරමින් තිබුණි.

ii. පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කාබනික පොහොර නිපදවීම සඳහා යොදාගත නොහැකි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි වෙනත් ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා යෙදවීම සහ ප්‍රමාණවත් ගිණි නිවීමේ උපකරණ හා පහසුකම් ක්‍රියාවලි භූමියේ ස්ථාපිත කිරීම යන නියමයන් හා කොන්දේසි ඉටු කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

(අ) භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

-------------------------------------------------

2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් පෙන්වාදී ඇති භාණ්ඩ ඌනතා 11 ක් සම්බන්ධයෙන් වූ නිර්දේශ 2017 ඔක්තෝබර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතන සඳහා කොඩි කණු ලබා දීම

-------------------------------------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ලැබී තිබුණු කොඩි කණු 600 කින් 2014 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු කොඩිකණු 279 ක් නැවත සභාවට ලබා ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්යය මණ්ඩලයට අයත් තනතුරු 12 ක 35 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 09 ක 17 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

(අ) බෙලිඅත්ත නව වෙළඳ සංකීර්ණයේ දෙවන හා තෙවන මහල බදු දීම

---------------------------------------------------------------------------

i. උක්ත ගොඩනැගිල්ලේ සැලසුම පරිදි සකස් කර තිබුණු පළමු හා දෙවන මහල්වල අභ්‍යන්තර හිස් අවකාශ සභාවේ අවසරයකින් තොරව මුළුමනින්ම ආවරණය කර බදුකරු විසින් ව්‍යාපාර කටයුතු සඳහා භාවිතා කර තිබුණි.

ii. උක්ත මහල් බදු දීමට අදාළ ගිවිසුමට පටහැනි ලෙස බදුකරු විසින් දෙවන මහලේ අංක 02 කඩ කාමරය වෙළඳාම සඳහා භාවිතයට ගැනීම සහ වෙළඳ සංකීර්ණයේ පසුපස කොටසේ දෙවන මහලේ සිට තුන්වන මහලක් ලෙස

කොන්ක්‍රීට් තට්ටු යොදා ප්‍රයෝජනයට ගතහැකි ලෙස සකස් කර ගෙන තිබීම පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බෙලිඅත්ත නව වෙළඳ සංකීර්ණය දෙවන මහල අංක 02 සහ අංක 03 කඩ කාමර බදු දීම

-----------------------------------------------------------------------------------------

i. 2009 වර්ෂයේ පෙබරවාරි මස සිට බදු දී තිබූ අංක 02 කඩ කාමරය සහ 2007 වර්ෂයේ අගෝස්තු මස සිට බදු දී තිබී, සභා තීරණයක් මත 2013 දෙසැම්බර් මාසයේදී නැවත සභාවට පවරාගෙන තිබූ අංක 03 කඩ කාමරය වෙනුවෙන් එම කාල වකවානුවලට අදාළව බිල්කර කුලී අයකර නොතිබුණි.

ii. මෙම කඩ කාමර සඳහා අයකර ගතයුතු එක්වන් මුදලින් පිළිවෙලින් රු. 238,000 ක් සහ රු. 200,000 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් හිඟව පැවතුණි.

(ඇ) බෙලිඅත්ත නව වෙළඳ සංකීර්ණයේ පළමු මහල අංක 34 කඩ කාමරය බදු දීම

-----------------------------------------------------------------------------------------

2008 වර්ෂයේ අගෝස්තු මස 20 දින ගිවිසුම්ගත වීමකින් තොරව බදුකරුට ලබා දී තිබූ මෙම කඩ කාමරය වෙනුවෙන් එදින සිට 2017 අගෝස්තු මස දක්වා කඩ කාමර කුලී බිල්කර අය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

----------------------------

### 3.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

සභාවේ කුට්ටිගල් නිෂ්පාදන හා කොහු මෝල ව්‍යාපෘතිවලට අදාළ යන්ත්‍රෝපකරණ වසර 01 සිට වසර 04 දක්වා කාලයක සිටද, කැනපි කුටි 6 ක් සහ කොම්පෝස්ට් ව්‍යාපෘතියේ මල්ටි චොපර් යන්ත්‍රය වසර 02 කට ආසන්න කාලයක සිටද, ධූමායන යන්ත්‍රය වසර 4 කට ආසන්න කාලයක සිටද, වාහන 03 ක් වසර 02 සිට 03 දක්වා කාලයක සිටද භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

### 3.5.2. වාහන උපයෝජනය

----------------------

සභාව විසින් භාවිතා කරන වාහන 12 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, වාහන 11 ක් සඳහා සමාලෝචිත වර්ෂයට වාර්ෂික ආදායම් බලපත්‍ර හා එක් වාහනයක් සඳහා වාර්ෂික රක්ෂණ සහතිකය ලබාගෙන නොතිබුණි.

## 3.6 හඳුනාගත් අලාභ

සභාව සතු රථ ගාලෙහි දීර්ඝ කාලයක සිට පුද්ගලික ආයතනයක බස් හා වෑන් රථ නවතා තැබීමට ඉඩ සලසා තිබූ නමුත්, එම ආයතනයෙන් ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ උබයරත්න මාර්ගය සංවර්ධනය කිරීමට අදාළව 2017 නොවැම්බර් මස 17 දින සිදු කළ භෞතික පරීක්ෂාව හා කුට්ටිගල්වල ගුණත්වය සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 08 දින ලද තත්ත්ව පරීක්ෂණාගාර ප්‍රතිඵල අනුව පරීක්ෂාවට ලක් කළ කුට්ටිගල් සියල්ලම නියමිත ප්‍රමිතියෙන් තොර බවට තහවුරු විය. ඒ අනුව මෙම කර්මාන්තය වෙනුවෙන් ගෙවීම් කර තිබූ රු. 387,411 ක මුදල ඵලදායි නොවන ගෙවීමක් බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 12,226,299 ක් වූ අතර, එම අගයයන්ගේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 30 ක් විය.

(ආ) ගමන් වියදම් විෂයෙහි අහිතකර විචලනය රු. 115,060 ක් වූ අතර, එම අගයෙහි ප්‍රතිශතය සියයට 25 ක් විය.

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජුනි 09 දිනැති අංක DAM/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ කමිටු 02 ක් පමණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සදහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | i. මූල්‍ය ප්‍රකාශනවල සහ උපයෝගී ලේඛනවල වටිනාකම් අතර වෙනස්කම් පැවතීම.<br>ii. විවිධ තැන්පතු ශේෂ නිරවුල් කර ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබීම.<br>ii. ගිවිසුම්ගත නොවී හා විධිමත් තක්සේරුවක් නොමැතිව කඩ කාමර බදු දී තිබුණු අවස්ථා පැවතීම.<br>iii. දීර්ඝ කාලයක සිට බිල් නොකළ කඩ කාමර පැවතීම. |
| (ඇ) අයවැය පාලනය | i. අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම.<br>ii. අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබීම. |